

# වාර්ෂික වාර්තාව
# 2014



## සංචාරක සංවර්ධන අරමුදල

# සංචාරක සංවර්ධන අරමුදල
# වාර්ෂික වාර්තාව - 2014

Invest in Sri Lanka

ශ්‍රී ලංකා සංචාරක
සංවර්ධන අධිකාරිය

2016 ජුලි 14

**ගරු ජෝන් අමරතුංග මැතිතුමා පා.ම**
**සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා**

**ගරු අමාත්‍යතුමනි**

**සංචාරක සංවර්ධන අරමුදල**

2005 අංක 38 දරණ සංචාරක පනතේ 23 (1) වගන්තිය අනුව සංචාරක සංවර්ධන අරමුදල ස්ථාපිත වී ඇති අතර මෙම අරමුදලෙහි මූල්‍යයන් සංචාරක සංවර්ධනය සහ ප්‍රවර්ධනය වෙනුවෙන් යෙදවිය යුතුවේ. මෙම අරමුදල වෙනුවෙන් මුල්‍යයන් එකතු කිරීම් සහ බෙදා හැරීම් 2003 අංක 25 දරණ මුදල් පනත සහ 2005 අංක 38 දරණ සංචාරක පනත අනුව තීරණය වේ.

2005 අංක 38 දරණ සංචාරක පනතේ 23 (2) (අ) වගන්තිය අනුව සංචාරක අපගමන බදු ආදායමෙන් 1/3 ක ප්‍රමාණයක් සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරීය වෙත ගෙවනු ලැබේ. තවද, සංචාරක ක්ෂේත්‍රයට අයත් ආයතන වලින් කාර්තු පදනම මත සංචාරක සංවර්ධන බදු වශයෙන්ද මෙම අරමුදලට එකුත් වේ.

2014 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදයට අදාල සංචාරක සංවර්ධන මූල්‍යයන්හි එකතුව රුපියල් මිලියන 2837.43ක් වේ. 2013 වසරේ එම මූල්‍ය ප්‍රමාණය රුපියල් මිලියන 2625.14 ක් වේ.

මෙම වාර්තාව මගින් 2014 වර්ෂය සඳහා සංචාරක සංවර්ධන අරමුදලට මූල්‍යයන් එකතුවීම සහ මූල්‍යයන් එකතුවීම සහ මූල්‍යයන් බෙදා හැරීම සම්බන්ධ විස්තර අඩංගු වී ඇත.

**ස්තුතියි**

**මෙයට විශ්වාසී**

**අ/කලේ**

**පී.එම්.විතාන**
**සභාපති**
**ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය**

# මූල්‍ය ප්‍රකාශන - පටුන


| | පිටු අංකය |
|---|---|
| මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය | 01 |
| මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනය | 02 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශනය | 03 |
| ගිණුම් වලට අදාල සටහන් | 04-07 |

### සංචාරක සංවර්ධන අරමුදල
### මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය
### 2014 දෙසැම්බර් 31 දිනට

| | සටහන | 2014 | 2013 |
|---|---|---|---|
| **ජංගම වත්කම්** | | රු. | රු. |
| මුදල සහ මුදල සමාන අයිතමයන් | | 251,099,525.02 | 822,889,099.72 |
| ලැබිය යුතු මුල්‍යයන් | 8 | 673,329,739.00 | 633,886,904.04 |
| **මුළු වත්කම්** | | **924,429,264.02** | **1,456,776,003.76** |
| **ජංගම වත්කම්** | | | |
| ගෙවිය යුතු මුල්‍යයන් | 9 | 3,380,858.23 | 3,890,830.99 |
| ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය | | 128,946,776.81 | 203,403,924.19 |
| ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය | | 644,733,884.05 | 1,017,019,620.94 |
| ශ්‍රී ලංකා සංචාරක හෝටල් කළමනාකරණ ආයතනය | | 110,525,808.69 | 174,346,220.73 |
| ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය | | 36,841,936.23 | 58,115,406.91 |
| **මුළු වගකීම්** | | **924,429,264.02** | **1,456,776,003.76** |

ගිණුම්මය ප්‍රතිපත්තීන් හා ගිණුම් සටහන් අනුව සටහන් අංක 04 සිට 07 දක්වා ඉහත මූල්‍ය ප්‍රකාශන වල සමස්ථයම අදාල වේ. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් මෙම අවසන් ගිණුම් පිලියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා වගකිව යුතු වේ. මෙම අවසන් ගිණුම් සහ මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් විසින් අනුමත කර ඇත.

**මල්රාජ් බී කිරිඇල්ල**
**අධ්‍යක්ෂ ජනරාල්**
**ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය**

**පී.එන්.දිසානායක**
**අධ්‍යක්ෂ / මූල්‍ය කළමනාකරණ**
**ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය**

**පී.එම්. විතාන**
**සභාපති**
**ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය**

### සංචාරක සංවර්ධන අරමුදල
### මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනය
### 2014 දෙසැම්බර් 31 දිනෙන අවසන් වර්ෂය සඳහා

| | සටහන | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|---|
| **ආදායම** | | | |
| බදු | 3 | 2,785,332,979.95 | 2,619,040,948.38 |
| අනෙකුත් ආදායම් | 4 | 52,099,002.02 | 6,099,936.95 |
| **මුළු ආදායම** | | **2,837,431,981.97** | **2,625,140,885.33** |
| **වියදම්** | | | |
| අරමුදලේ පරිපාලන වියදම් | 5 | 5,182,686.97 | 5,193,657.45 |
| මූල්‍ය වියදම් | 6 | 26,922.96 | 5,943.00 |
| අරමුදල බෙදාහැරීම් | 7 | 2,832,222,372.04 | 2,619,941,284.88 |
| **මුළු වියදම** | | **2,837,431,981.97** | **2,625,140,885.33** |
| **අතිරික්තය (ඌනතාවය)** | | - | - |

**ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අරමුදල**
**මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

| | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|
| **මූල්‍ය ප්‍රවාහ මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින්** | | |
| **ලැබීම්** | | |
| බදු මුදල් | 2,766,453,590.82 | 2,393,028,682.27 |
| වෙනත් ආදායම් | 40,000,404.00 | 58,809.08 |
| **ගෙවීම්** | | |
| ණයහිමියන්ට ගෙවීම් | (3,370,720,222.26) | (1,844,836,228.10) |
| වෙනත් ගෙවීම් | (7,523,347.26) | (3,714,743.05) |
| **ශුද්ධ මුදල් ප්‍රවාහය මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින්** | **(571,789,574.70)** | **544,536,520.20** |
| **මුදල් ප්‍රවාහය ආයෝජන ක්‍රියාකාරකම් තුළින්** | | |
| යන්ත්‍ර සහ උපකරණ මිලදී ගැනීම් | - | - |
| යන්ත්‍ර සහ උපකරණ විකිණීම් | - | - |
| **ශුද්ධ මුදල් ප්‍රවාහය ආයෝජන ක්‍රියාකාරකම් තුලින්** | - | - |
| **මුදල් ප්‍රවාහය මූල්‍ය ක්‍රියාකාරකම් තුලින්** | | |
| ණයට ගැනීම් සඳහා ඉදිරිපත් කිරීම | - | - |
| නැවත ගෙවීම් සඳහා ණයට ගැනුම් | - | - |
| රජයට බෙදා හරිනු ලැබූ ලාභාංශ | - | - |
| **ශුද්ධ මුදල් ප්‍රවාහය මූල්‍ය ක්‍රියාකාරකම් තුලින්** | - | - |
| **ශුද්ධ වැඩිවීම් (අඩුවීම්) මුදල් සහ මූල්‍ය සමාන දේ** | **(571,789,574.70)** | **544,536,520.20** |
| **මුදල් සහ මුදල් සමාන දේ වසර මුල** | **822,889,099.72** | **278,352,579.52** |
| **මුදල සහ මුදල සමානදේ වසර අග** | **251,099,525.02** | **822,889,099.72** |

## ගිණුම් වලට අදාල සටහන්

### 1. සංචාරක සංවර්ධන අරමුදල

2005 අංක 38 දරණ සංචාරක පනතේ 23(1) වගන්තිය යටතේ සංචාරක අරමුදල ස්ථාපිත වී ඇත. මෙම අරමුදලේ මුල්‍යයන් සංචාරක සංවර්ධනය සහ ප්‍රවර්ධනය සඳහා යොදවනු ලබයි. සංචාරක සංවර්ධන බදු එකතු කිරීම සහ බෙදා හැරීම 2003 අංක 28 දරණ මුදල් පනතේ සහ 2005 අංක 38 දරණ සංචාරක පනත අනුව සිදු වේ.

### 2. ගිණුම්කරණ අවශ්‍යතාවය

අරමුදලේ ගිණුම සකස් කිරීම ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ගිණුම් ප්‍රමිත සහ ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන්ට අනුව පිළියෙල කර ඇත.

### 3. බදු - අරමුදල් සම්පත්

| | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|
| අපගමන බදු | 1,779,766,146.71 | 1,604,887,048.67 |
| සංචාරක සංවර්ධන බදු | 1,005,566,833.24 | 1,014,153,899.71 |
| **එකතුව** | **2,785,332,979.95** | **2,619,040,948.38** |

### 3.1 අපගමන බදු

සංචාරක පනතේ 23 (2) (අ) වගන්තිය යටතේ සමස්ථ අපගමන බදු ආදායමෙන් 1/3ක ප්‍රමාණයක් සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට ගෙවනු ලැබේ.

| **අපගමන බදු** | රු. |
|---|---|
| 2014 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා අපගමන බදු ලැබීම් | 1,494,348,292.15 |
| 2014 වසරේ නොවැම්බර් සිට දෙසැම්බර් දක්වා ලැබිය යුතු අපගමන බදු (වෙන්කිරීම්) | 285,417,854.56 |
| **2014 වසර සඳහා සමස්ථ අපගමන බදු** | **1,779,766,146.71** |

### 3.2 සංචාරක සංවර්ධන බදු

2003 අංක 28 දරණ මුදල් පනත අනුව සංචාරක ක්ෂේත්‍රයට අයත් සෑම ආයතනයක්ම සංචාරක සංවර්ධන බදු ගෙවිය යුතු වේ. මෙම සංචාරක සංවර්ධන බදු මූල්‍ය එකතු කිරීම් / බැර කිරීම් සංචාරක සංවර්ධන අරමුදලට කරනු ලැබේ. 2014 ජනවාරි සිට දෙසැම්බර් දක්වා අදාල කාල පරිච්ඡේදය තුල රුපියල් මිලියන 648.8ක මුදලක් බදු වශයෙන් එකතු වී ඇත. තවද 2014 ඔක්තෝබර් - දෙසැම්බර් කාල පරිච්ඡේදය සඳහා අපගමන බදු වශයෙන් රු. මිලියන 357ක මුදලක් ඇස්තමේන්තු ගත ආදායම ලෙස ගිණුම් ගත කොට ඇත.

| **සංචාරක සංවර්ධන අරමුදල** | රු. |
|---|---|
| | |
| මූල්‍ය ලැබීම් ජනවාරි සිට දෙසැම්බර් දක්වා 2014 | 648,801,438.52 |
| 2014 වසරේ නොවැම්බර් සිට දෙසැම්බර් දක්වා ලැබිය යුතු මූල්‍යයන් (වෙන්කිරීම්) | 357,000,000.00 |
| සංචාරක සංවර්ධන බදු නැවත ගෙවීම් | (234,605.28) |
| **2014 ජනවාරි සිට දෙසැම්බර් දක්වා මුළු සංචාරක සංවර්ධන බදු ආදායම** | **1,005,566,833.24** |
| | |

4. වෙනත් ආදායම්

වෙනත් ආදායම් ලෙස ගිණුම් ගත කොට ඇති වටිනාකම තුල අන්තර්ගත වන්නේ මුදල් පහත ප්‍රකාරව නියමිත දිනට ගෙවීම් සිදු නොකල ලියාපදිංචි ආයතනයන්හි ප්‍රමාද ගෙවීම් මත අයකල පොලී ආදායම හා අගරු චෙක්පත් සඳහා ලද අතිරික්ත ලැබීම් ප්‍රමානයයි. මෙම මූල්‍ය වසර තුල සංචාරක සංවර්ධන අරමුදලට ශ්‍රී ලංකා සම්මුති කාර්යංශයේ වියදම් නොකල මූල්‍ය ප්‍රමානයන් සඳහා අදාල අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව ලැබී ඇත.

| | Rs: |
|---|---:|
| 2014 වසර සඳහා බදු පමා කිරීමේ පොලිය එකතු කිරීම | 12,045,561.02 |
| අදාල මංඩලිය තීරණය අනුව ශ්‍රී ලංකා සම්මුති කාර්යංශයේ වියදම් නොකල මූල්‍ය ලැබීම් | 40,000,000.00 |
| අතිරික්ත ලැබීම් / අගරු චෙක්පත් හිමියන්ගෙන් | 404.00 |
| නැවත මූල්‍ය ලැබීම් මූල්‍යයනය සඳහා ඉදිරිපත් නොකරන ලද | 53,037.00 |
| **එකතුව** | **52,099,002.02** |

5. අරමුදල් පරිපාලන පිරිවැය

| | 2014<br>රු. | 2013<br>රු. |
|---|---:|---:|
| මුද්දර ගාස්තු | 65,525.00 | 63,250.00 |
| පරිපාලන වියදම් | 5,088,061.98 | 5,101,267.45 |
| විගණන ගාස්තු | 29,100.00 | 29,100.00 |
| තැපැල් ගාස්තු | - | 40.00 |
| **එකතුව** | **5,182,686.98** | **5,193,657.45** |

6. මූල්‍ය පිරිවැය

| | 2014<br>රු | 2013<br>රු |
|---|---:|---:|
| බැංකු ගාස්තු | 26,922.96 | 5,943.00 |
| **එකතුව** | **26,922.96** | **5,943.00** |

7. අරමුදල බෙදාහැරීම්

2005 අංක 38 දරණ සංචාරක පනතේ 24 (8) වගන්තිය අනුව අරමුදල බෙදා හැරීම පහත දැක්වෙන පරිදි වසර තුළ සිදුවිය

| | රු | රු |
|---|---:|---:|
| ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය | 396,511,132.09 | 366,791,779.88 |
| ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යංශය | 1,982,555,660.43 | 1,833,958,899.42 |
| ශ්‍රී ලංකා සංචාරක හෝටල් කළමනාකරණ ආයතනය | 339,866,684.64 | 314,392,954.19 |
| ශ්‍රී ලංකා සම්මුති කාර්යංශය | 113,288,894.88 | 104,797,651.40 |
| **එකතුව** | **2,832,222,372.04** | 2,619,941,284.88 |

8. ලැබිය යුතු මුල්‍ය

| | 2014<br>රු | 2013<br>රු. |
|---|---|---|
| ලැබිය යුතු අපගමන බදු | 285,417,854.56 | 281,698,177.87 |
| ලැබිය යුතු සංචාරක සංවර්ධන බදු | 387,588,521.21 | 352,000,000.00 |
| ණයගැතියන් | 323,363.23 | 188,726.17 |
| **එකතුව** | **673,329,739.00** | **633,886,904.04** |

9. ගෙවිය යුතු මුල්‍ය

| | 2014<br>රු | 2013<br>රු |
|---|---|---|
| උපචිත වියදම් # පරිපාලන පිරිවැය | 3,022,527.95 | 3,761,568.99 |
| උපචිත වියදම් # විගණන ගාස්තු | 58,200.00 | 29,100.00 |
| උපචිත වියදම් - මුද්දර ගාස්තු | 65,525.00 | 47,125.00 |
| වෙනත් ජංගම වගකීම් | 234,605.28 | 53,037.00 |
| **එකතුව** | **3,380,858.23** | **3,890,830.99** |

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
## கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
## AUDITOR GENERAL'S DEPARTMENT


මගේ අංකය / எனது இல. / My No. } ටීඑම්/කේ/ටීඩීඑෆ්/1/14/01 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2015 ජූනි 12 දින

17 JUN 2015 FINANCE DIVISION

D/F

සභාපති,

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය.

**ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව.**

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති (වැඩබලන)

පිටපත් : 1. ලේකම් - සංචාරක හා ක්‍රීඩා අමාත්‍යාංශය

2. ලේකම් - මුදල් අමාත්‍යාංශය

Sri Lanka Tourism Development Authority
CHAIRMAN'S OFFICE
JUN 2015
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
සභාපති කාර්යාලය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka

+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
# கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
# AUDITOR GENERAL'S DEPARTMENT


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ටීඑම්/කේ/ටීඩීඑෆ්/1/14/01 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2015 ජුනි 12 දින |

17 JUN 2015
FINANCE DIVISION

සභාපති,

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය.

**ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව.**

---

සංචාරක සංවර්ධන අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලිකිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 20 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. අරමුදලේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම.

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද

යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් හා හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම්කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

2. මූල්‍ය ප්‍රකාශන.
-----------------

2.1 මතය
--------

මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට සංවාරක සංවර්ධන අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.
------------------------------------------

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම.
--------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල පෙර වර්ෂ කාලපරිච්ඡේදයට ගැලපිය යුතු රු.30,588,521 ක ආදායම් අධි ප්‍රතිපාදනයක් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 03 අනුව සංසන්දනාත්මක අගයන් නිවැරදි කර නැවැත ප්‍රකාශකර නොතිබුණි.

2.3 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

පහත සඳහන් අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 24(2) වගන්තිය සංයෝජිතව කියවිය යුතු 2003 අංක 25 දරන මුදල් පනතේ 11 කොටස | සංචාරක බදු අය කර ගැනීමේ වාර්තා සංචාරක සංවර්ධන බදු (සං.සං.බ) අය කර දින 30 ක් ඇතුළත් මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතු වේ. එසේ වුවත් අරමුදල මෙම නියමයන්ට අනුකූල වී නොතිබුණි. |
| (ආ) 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ | |
| I. 24 (3) වගන්තිය | සංචාරක සංවර්ධන බද්ද කළමනාකරණය කිරීම සහ පරිපාලනය කිරීම සඳහා රීති සාදා නොතිබුණි. |
| II. 24 (8) වගන්තිය | සංචාරක සංවර්ධන අරමුදලේ බැරට ඇති සියළු මුදල් අදාල ආයතන වෙත බෙදා හැරිය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට අරමුදලේ බැරට රු.250,727,130 ක මුදලක් පැවතියද එම මුදල් බෙදාහැරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) 2003 අංක 25 දරන මුදල් පනතේ 2 (ආ) උප වගන්තිය | ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන නැවකින් ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන මගියෙකු සඳහා නිකුත් කරන සෑම ටිකට් පතකින්ම බදු අයකර ඉන් කොටසක් අධිකාරිය වෙත ප්‍රේෂණය කළ යුතු වුවත් එලෙස නැව් මගින් ගමන්කරන මගීන්ගෙන් බදු අයකර අධිකාරිය වෙත එවා නොතිබුණ අතර නැව් මගින් ගමන් ගන්නා මගීන්ගෙන් අයවීම් නොමැති බවට සනාථ කිරීමද ලබාගෙන නොතිබුණි. |

| | |
|---|---|
| (ඈ) මුදල් රෙගුලාසි අංක 169(2) | චෙක්පත් උපලබ්ධි වීමට පෙර ආයතනය සේවා සපයා තිබූ චෙක්පත් 07කට අදාළ රු.143,504ක මුදලක් අයකර ගැනීමට නොහැකිව තිබුණි. |

3. මූල්‍ය සමාලෝචනය.

3.1 මූල්‍ය ප්‍රතිඵල.

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ අරමුදලේ මෙහෙයුම් කටයුතුවලින් ජනනය වූ ආදායම රු. මිලියන 2,837 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම රු. මිලියන 2,625 ක් වූයෙන් ආදායමෙහි රු. මිලියන 212 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. අපගමන බදු ආදායම වැඩි වී තිබීම ආදායමේ වැඩිවීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය.

සමාලෝචිත වර්ෂයේදී අරමුදලේ ආදායම රු.මි.2,837 ක් වූ අතර එය ඉකුත් වර්ෂයේ වූ රු. මිලියන 2,625 සමඟ සැසඳීමේදී සියයට 8.07 ක වැඩිවීමක් පෙන්නුම් කෙරුණි. එසේම ඉකුත් වර්ෂයේ අරමුදලේ වෙනත් ආදායම් වශයෙන් එකතු කර තිබුණු රු. මිලියන 6 සමග සැසඳීමේදී සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 52 ක් එකතු කර තිබුණි. ඒ අනුව වෙනත් ආදායම් සියයට 766.6 ක වැඩිවීමක් පෙන්නුම්කර තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය.

4.1. කළමනාකරණ අකාර්යක්ෂමතා.

4.1.1 ආදායම් අත්හැරීම.

සංචාරක කටයුතු පනත යටතේ බලපත්‍රලත් සෑම ආයතනයක් විසින්ම 2003 අංක 25 දරන මුදල් පනතේ 11 වන වගන්තියේ දක්වා ඇති පරිදි සංචාරක සංවර්ධන බදු මුදලක් ගෙවිය යුතු අතර ඒ සඳහා 2003 දෙසැම්බර් 11 දිනැති අංක 1318 / 24 දරන අතිවිශේෂ ගැසට්පත්‍රයේ දක්වා ඇති ආකෘති පත්‍රය අනුව සංචාරක සංවර්ධන බදු මුදල් අයකිරීමේදි වෙනත් ආදායම් යටතේ දක්වා ඇති ආදායම් ප්‍රභවයන් කිහිපයක් අත්හැරීම නිසා රු.20,790,729ක ආදායමක් අහිමි වී තිබුණි.

4.1.2 අරමුදල් කළමනාකරණය.

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අරමුදල් මඟින් පරිපාලන වියදම් ලෙස රු. 5,088,062 ක මුදලක් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය වෙත ගෙවා තිබුණි. එසේ වුවත්, පරිපාලන වියදම් ගෙවීමට 2005 අංක 38 දරන සංචාරක පනතේ විධිවිධාන සලසා නොතිබුණි.

(ආ) 2003 අංක 25 දරන මුදල් පනතේ විධිවිධාන අනුව 2003 අගෝස්තු 29 දිනැති අංක 1303/22දරන අති විශේෂ ගැසට් නිවේදනය අනුව අපගමන බද්ද ගුවන් මගින් පිටවන සෑම තැනැත්තෙකුගෙන්ම එක්සත් ජනපද ඩොලර් 15 ක්ද, නැවකින් පිටත්වන සෑම තැනැත්තෙකුගෙන්ම එක්සත් ජනපද ඩොලර් 2.5 ක් අය කළ යුතු වුවද, මෙම අපගමන බද්ද අය කරන සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 2004 වර්ෂයේ සිට 2012 දෙසැම්බර් 31 දින දක්වා එක්සත් ජනපද ඩොලර් එකකට රු 100 ක විනිමය හුවමාරු අනුපාතයක් පදනම් කරගෙන මෙම බද්ද අය කර තිබීමෙන් 2012 වර්ෂයේදී හා ඊට පෙර වර්ෂවලදී අරමුදලට ලැබිය යුතු අපගමන බදු සැලකිය යුතු ප්‍රමාණයක් අහිමි වී තිබුණි.එම ප්‍රමාණය 2012 වර්ෂයේදී පමණක් රු. මිලියන 300 ක් බව හෙළිදරව් විය.

(ඇ) සංචාරක සංවර්ධන බදු අයකර ගත යුතු ආයතන පිළිබඳව දත්ත සමුදායක් සකස් කර නොතිබුණි. තවද ඒ ඒ වර්ෂවල අය කළ බද්ද හා ආයතනවල විකුණුම් ආදායම ලේඛනගත කර නොතිබු හෙයින් හිඟ බදු පිළිබඳව නියාමනයක් සිදු වී නොතිබුණි.

(ඈ) 2003 දෙසැම්බර් 11 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට්පත්‍රයේ 1 හා 4 ඡේදයන්හි නියෝග ප්‍රකාර සංචාරක බදු මුදල් නියමිත කාල පරිච්ඡේදය තුළ නොගෙවීම නිසා පනවන ලද දඩ මුදල් ප්‍රමාණවත් නොවීම මත අධිකාරියට මූල්‍යමය හානියක් සිදුවී තිබුණි.

(ඉ) 2003 අංක 25 දරන මුදල් පනතේ 4(2) වගන්තිය ප්‍රකාර ගුවන් සමාගම් විසින් නියමිත කාලය තුළ බදු නොගෙවන අවස්ථාවලදී අදාල දඩ පොලී සමග එකී මුදල් අයකර අධිකාරිය වෙත ප්‍රේෂණය කරන්නේද යන්න තහවුරු කිරීම් කරවාගෙන නොතිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය.

5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ආයතන යහපාලනය පිළිබඳ චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත අවසන් ගිණුම් ඉදිරිපත් කළයුතු වුවත් 2014 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2015 අප්‍රේල් 02 දිනය.

5.2 අයවැය ලේඛනමය පාලනය.

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත හා තථ්‍ය අගයන් අතර විෂයයන් 05 ක් සම්බන්ධයෙන් සියයට 6 සිට සියයට 100 දක්වා සැලකිය යුතු විචලන නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන තිබුණු බව දක්නට නොලැබුණි.

6. පද්ධති හා පාලනයන්.

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය.
(ආ) අරමුදල් බෙදා හැරීම.
(ඇ) සංචාරක සංවර්ධන බදු එකතු කිරීම.
(ඇ) අපගමන බදු එකතු කිරීම.
(ඉ) බලපත්‍ර හිමි ආයතනවල මූල්‍ය වාර්තා සමාලෝචනය.

ඩබ්ලිව්.පී.සී වික්‍රමරත්න
විගණකාධිපති ( වැඩබලන)

